# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2104/9 - 2018 දෙසැම්බර් මස 31 වැනි සඳුදා - 2018.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 6/2001 (iv)

### 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 16 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 112 වැනි වගන්තිය යටතේ මුදල් සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මංගල සමරවීර,
මුදල් සහ ජනමාධ්‍ය අමාත්‍ය.

2018 දෙසැම්බර් මස 31 වැනි දින,
කොළඹ 01.

නියෝග

කලින් කල සංශෝධිත පරිදි වූ 2005 ඔක්තෝබර් මස 12 වැනි දින අංක 1414/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 2005 රක්ෂණ නියාමන කොමිෂන් සභා නියෝගවල 3 වැනි නියෝගය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් එම නියෝග, මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

"3. රක්ෂණකරුවකු විසින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත වාර්ෂික ගාස්තුවක් වශයෙන්,

(අ) මෙහෙයුම් කටයුතු සිදුකරනු ලබන පළමු ලිත් වර්ෂය සඳහා රුපියල් ලක්ෂ එකක් වූ මුදලක් ගෙවනු ලැබිය යුතු ය ඃ

එසේ වුව ද, 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනතේ 53 වැනි වගන්තියට අනුකූලව ක්‍රියාකිරීමට නියම කරනු ලැබ ඇති යම් රක්ෂණකරුවකු විසින්, මෙහෙයුම් කටයුතුවල පළමු ලිත් වර්ෂය සඳහා දළ ලිඛිත රක්ෂණ වාරිකයෙන් 0.125% ක් වූ වාර්ෂික ගාස්තුවක් ; සහ

(ආ) මෙහෙයුම් කටයුතු ආරම්භ කරනු ලබන දෙවන ලිත් වර්ෂයේ සිට සහ එම දිනයෙන් පසුව-

(i) රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් රුපියල් ලක්ෂ දෙකක මුදලක් ; හෝ

(ii) පූර්ව මුදල් වර්ෂයේ රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත රක්ෂණ වාරිකයෙන් 0.125% ක් වූ මුදලක් ;

යන මුදල් ප්‍රමාණ දෙකෙන් වැඩි මුදල,

ගෙවනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.